## සුළු හා සුක්ෂම කර්මාන්ත ප්‍රමඛ හා ව්‍යවසාය ප්‍රවර්ධන III ව්‍යාපෘතිය ( එස්එම්අයිඑල්ප් - III ) 2010

------------------------------------------------------------------------------------------------------

1. **මතය.**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වු මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ යෙන් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකුලව ප්‍රතිපුර්ණයන් සඳහා වු ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ ( විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතීන් වලට අනුකුල වී ඇති බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන.**

---------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය.**

------------------------

මුල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද වියදම් වල එකතුව රු.282,704,482 ක් වු අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත තත්ත්වය

රු.9,321,199,607 ක් විය. ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා පෙර වර්ෂය සඳහා වියදම සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත දැක්වේ.

| **සහභාගීත්ව ණය ආයතන (PCIS)** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත මුදල** |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| ලංකා බැංකුව ( BOC ) | 126,218,220 | 278,562,642 | 1,585,991,789 |
| වානිජ බැංකුව ( CB ) | 119,182,915 | 536,562,688 | 3,712,999,441 |
| ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව (DFCC) | 7,316,894 | 149,361,738 | 1,682,398,739 |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | - | 104,511,489 | 704,458,713 |
| සම්පත් බැංකුව (SB) | - | 45,879,975 | 1,353,143,828 |
| වයඹ සංවර්ධන බැංකුව (WDB) | 13,964,999 | 15,172,495 | 82,930,726 |
| හැටන් නැෂනල් බැංකුව (HNB ) | - | 47,083,668 | 133,596,661 |
| කඳුරට සංවර්ධන බැංකුව ( KDB) | 16,021,454 | 41,013,256 | 65,679,710 |
| එකතුව | 282,704,482 | 1,218,147,951 | 9,321,199,607 |

## 2.2 විශේෂ (යෙන් ) ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (යෙන් ) ගිණුමේ මෙහෙයුම් 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | **2010** | | **2009** | |
|---|---|---|---|---|
| | ජපන් යෙන් | ශ්‍රී.ලං.රු. | ජපන් යෙන් | ශ්‍රී.ලං.රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 80,185,726 | 99,534,542 | 405,721,395 | 508,125,475 |
| එකතුකළා | | | | |
| වර්ෂය තුළ ලැබීම් | 144,440,395 | 181,738,908 | 651,071,224 | 808,379,079 |
| විදේශ විනිමය ලාභය | - | 1,431,033 | - | 1,177,939 |
| | 224,626,121 | 282,704,483 | 1,056,792,619 | 1,317,682,493 |
| අඩුකළා | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ආපසු ගැනීම් | 224,626,121 | 282,704,483 | 976,606,893 | 1,218,147,951 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත | 80,185,726 | 99,534,542 |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණ සහාය ණය සහ සාමාන්‍ය ණය වල එක් එක් සංරචකය සඳහා උප ණය පිළිබඳ පගතිය මූල්‍ය ප්‍රකාශන වල වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමුච්චිත ණය වියපැහැදම් සාරාංශ දිස්ත්‍රික් අනුව සහ අංශ අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝග්‍යතා නිෂ්කාශනය ( Eligibility Clearance ) නිකුත් කිරීම සම්බන්ධයෙන් තොරතුරු සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළ උප ණය සඳහා ලබාදුන් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රු.5,498,356 ක් වූ ස්ථාවර වත්කම් වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ වෙනත් එවැනි ප්‍රමාණවත් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එවකට ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වූ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් වර්තමානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශයට එම වත්කම් භාරදීම සම්බන්ධයෙන් වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව විධිමත් සාක්ෂි නොවීම හේතුවෙන් එම වත්කම් වල පැවැත්ම හා වටිනාකම විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පෞද්ගලික පඩිනඩි ලෙස රු.4,239,778 ක මුදලක් ගෙවා තිබුණද, පැමිණීමේ වාර්තා , වැටුප් හා වේතන වාර්තා , අතිකාල හා නිවාඩු දින වැටුප්

වාර්තා ආදී අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ගෙවීම් වවුචර් වලට අනුව , වැටුප් ලබාගන්නා ඇතැම් අවස්ථා වලදී සේවකයන් විසින් වවුචර් අත්සන් කර නොතිබුණි.

(ඈ) ඉන්ධන , ලිහිසි තෙල්, බලපත්‍ර හා රක්ෂණ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.154,137 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, අදාළ නිල වාහන සඳහා දෛනික ධාවන සටහන් , ලොග් පොත් ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දුරකථන 04 ක් සඳහා රු.309,851 ක මුදලක් දුරකථන ගාස්තු ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දුරකථන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ක්‍රියාත්මක කරමේ නියෝජ්‍යායතනය වෙනස්වීමේදී එම දුරකථන භාරදීම සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) " Impact Monitoring Study - SMILE - III Project " පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම සඳහා උපදේශකවරුන් දෙදෙනෙකුට රු.100,000 ක් වු වෘත්තීය ගාස්තු , අත්තිකාරමක් ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, ලබාගත හැකි වු තොරතුරු අනුව, උපදේශකවරුන් විසින් අත්සන් කරන ලද යොමුගත කරුණු ( TOR) ප්‍රකාරව ඉහත සඳහන් වාර්තාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි.

3.3 **අරමුදල් උපයෝජනය**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වියපැහැදම් පරිපාටිය**

------------------------

මෙම ව්‍යාපෘතිය යටතේ 2004-2010 වර්ෂ සඳහා ඇස්තමේන්තුගත ණය ප්‍රතිපාදනය ජපන් යෙන් මිලියන 9,619 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ණය මුදලේ මුළු විය පැහැදම ජපන්යෙන් මිලියන 9,603 ක් එනම් 99.8% ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අවසාන භාවිතා කරන්නාගේ තාක්ෂණික , කළමනාකරණ හා ගිණුම්කරණ කුසලතා සංවර්ධනය කිරීම සඳහා පුහුණු පිරිවැය ආවරණය කිරීම සඳහා හෝ උපදේශක සේවා පිරිවැය ආවරණය කිරීම සඳහා හෝ තත්ත්ව පාලනය සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා ණය ගිවිසුමේ උපලේඛන 01 හි 1 (4) (ආ) වගන්තිය ප්‍රකාර, විෂය පථය සහිතව මුළු ණය මුදලෙන් ජපන් යෙන් මිලියන 157 ක මුදලක් තාක්ෂණ හුවමාරු ණය සඳහා වෙන් කර තිබුණද , 2009 වර්ෂය අවසානය දක්වා

ජපන් යෙන් මිලියන 10.9 ක මුදලක් එනම් 6.9% ක් පමණක් වියදම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණ හුවමාරු ණය උපයෝජනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ණය ගිවිසුමේ උපලේඛන 01 හි 1(4)(අ) වගන්තිය ප්‍රකාරව , සාමාන්‍ය ණය පිළිබඳ විෂය පථය වන්නේ සුළු හා කුඩා පරිමාණ කර්මාන්ත වල ඵලදායිතා ධාරිතාවය වැඩිදියුණු කිරීමයි. ලබාගත හැකි වු තොරතුරු අනුව , ණය විය පැහැදම් රටාව ආංශික වශයෙන් පහත පරිදි විය.

| අංශය | 2010 වර්ෂය තුළ සිදුකරනලද විය පැහැදම් | වියපැහැදම ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|
| | රු.මිලියන | % |
| සේවා | 69.79 | 25 |
| ඉදිකිරීම් | 25.08 | 9 |
| ලෝහ වැඩ | 18.35 | 6 |
| ඇඟළුම් | 5.22 | 2 |
| කෘෂිකර්මාන්ත | 9.97 | 4 |
| දැව හා දැව නිෂ්පාදිත | 12.72 | 4 |
| සත්ව පාලනය | 13.37 | 5 |
| ආහාර සැකසීම | 67.01 | 24 |
| විවිධ | 9.58 | 3 |
| රබර් නෂ්පාදිත | 7.46 | 3 |
| රෙදි නිෂ්පාදිත | 9.91 | 4 |
| ප්‍රවාහනය | 12.25 | 4 |
| ප්ලාස්ටික් නිෂ්පාදිත | 3.82 | 1 |
| මුද්‍රණ හා කඩදාසි නිෂ්පාදිත | 14.68 | 5 |
| රසායනික නිෂ්පාදිත | 3.50 | 1 |
| එකතුව | 282.71 | 100 |

ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද සාමාන්‍ය ණය වලට අදාළව රු.මිලියන 282.71 ක මුළු වියපැහැදමෙන් රු.මිලියන 69.79 ක මුදලක් එනම් 24.7% ක් සහ රු.මිලියන 67.01 ක් එනම් 23.7% ක මුදලක් පිළිවෙලින් සේවා සහ ආහාර සැකසුම් සඳහා පමණක් විය පැහැදම් කර තිබුණු අතර මුළු විය

පැහැදමෙන් ඉතිරි රු.මිලියන 145.91 ක් එනම් 51.6% ඉතිරි අංශ 13 සඳහා වියපැහැදම් කර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුළදී අසාමාන බෙදාහැරීමක් දැක්වුණි.

(iii) ලබාගත හැකිවූ තොරතුරු අනුව, දිස්ත්‍රික් අනුව වියපැහැදම් රටාව පහත පරිදි වේ.

| **දිස්ත්‍රික්කය** | **2010 වර්ෂය තුළ කරන ලද වියපැහැදම්** | **වියපැහැදම ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|
| | **රු.මිලියන** | **%** |
| කළුතර | 19.73 | 7 |
| බදුල්ල | 2.03 | 1 |
| මහනුවර | 27.48 | 10 |
| කොළඹ | 55.57 | 20 |
| ගම්පහ | 67.55 | 24 |
| මාතලේ | 4.67 | 2 |
| පොළොන්නරුව | 7.00 | 2 |
| කුරුණෑගල | 49.89 | 17 |
| කෑගල්ල | 6.79 | 2 |
| ගාල්ල | 18.41 | 6 |
| පුත්තලම | 13.25 | 5 |
| නුවරඑළිය | 8.24 | 3 |
| හම්බන්තොට | 2.10 | 1 |
| එකතුව | 282.71 | 100 |

ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු සාමාන්‍ය ණය රු.මිලියන 282.71 ක වියපැහැදමෙන් රු.මිලියන 173.01 ක මුදලක් එනම් මුළු වියපැහැදමෙන් 61.19% ක් දිස්ත්‍රික් තුනක පමණක් බෙදාදී තිබුණි. ඉතිරි රු.මිලියන 109.70 ක වියපැහැදම් දිස්ත්‍රික් 10 ක් සඳහා වු අතර , එයින් පෙනී යන්නේ අරමුදල් වල අසමාන බෙදාහැරීමක් වු බවයි. එසේම ඉතිරි දිස්ත්‍රික් 12 සඳහා කිසිඳු ණය මුදලක් බෙදාහැර නොතිබුණු බව අනාවරණය විය.

**(ආ) ණය වියපැහැදම පිළිබඳ කරුණු**

සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ණය වියපැහැදම රු.මිලියන 9,321.2 ක් වු අතර එයින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද වියපැහැදම රු.මිලියන 282.71 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ලබාගත හැකි වු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද වියපැහැදම සතුටදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් වාර්තා, ලිපිගොනු, වෙනත් ලියකියවිලි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වා නොතිබුණි. ඒ අනුව උප ව්‍යාපෘති සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව , ව්‍යාපෘති ඇගයීම් වාර්තා, යෝග්‍යතා නිෂ්කාශන වාර්තා , ණය අනුමත කිරීම් සහ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට හේතු , ණය අනුමත කිරීමේ ප්‍රමාදයන්, වියපැහැදම් ප්‍රමාදයන් , කාර්තුමය ප්‍රගති වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයන් 166 දෙනෙකුට රු.මිලියන 282.71 ක ණය ලබාදී තිබුණි. කෙසේ වුවද, ණය ලියකියවිලි 166 කින් රු.මිලයන 41.6 ක් එනම් 14.7% ක් වු ණය 17 ක් සඳහා පමණක් ඉල්ලුම් පත්‍ර ඇතුළු ණය ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කරන ලද රු.මිලියන 282.71 ක් වු ණය අතුරින් රු.මිලියන 272.1 ක මුදලක් එනම් 96% ක් 2010 ජනවාරි 01 සිට මැයි 31 දක්වා වු මාස 5 ක කාල පරිච්ඡේදය තුළ වියපැහැදම් කර තිබු අතර ඉතිරි රු.මිලියන 10.7 ක මුදල එනම් 4% ක් 2010 ජුනි 01 සිට මාස 07 ක කාල පරිච්ඡේදය තළ විය පැහැදම් කර තිබුණි. එබැවින්, 2010 මැයි මාසයෙන් පසුව ණය ලබාදීම සඳහා විධිමත් පරිපාටියක් අනුගමනය කර නොතිබු බව අනාවරණය විය.

(iv) ණය ප්‍රගතිය පරික්ෂා කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ගන්නා ලද පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුළ සම්පත් බැංකුව , හැටන් නැෂනල් බැංකුව හා ජාතික සංවර්ධන බැංකුව හරහා ණය වියපැහැදම් කර නොතිබුණි.

(vi) ණය හා පොලී අයකර ගැනීම් පිළිබඳ පුර්ව උපකල්පන ලේඛනයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) චක්‍රීය අරමුදල් ගිණුම**

----------------------

ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 3(6) වගන්තිය ප්‍රකාරව, එස්එම්අයිඑල්ඊ(SMILE) චක්‍රීය අරමුදල් ගිණුම III හි අනුව යොමු කරන ලද උප ණය ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ ) ගිණුමක් ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කළ යුතු අතර එම උප ණය වල ප්‍රාග්ධන මුදල හා ඒ මත පොලී එකී ගිණුමට බැර විය යුතුය. උප ණය හා ඒ මත පොලී ආපසු ගෙවීමේදී ජනනය වන අරමුදල් ශ්‍රී ලංකා රජය විසින් ණය මුදලේ ප්‍රාග්ධන හා පොලී මුදල ආපසු ගෙවීම සඳහා සහ එස්එම්අයිඑල්ඊ (SMILE) චක්‍රීය අරමුදල් ගිණුම III හරහා ව්‍යාපෘතියේ එම අරමුණුම , වාර හා කොන්දේසි මත සහභාගීත්ව ණය ආයතන වලට (PCI) ණය දීමට භාවිතා කළ යුතුය. කෙසේ වුවද රු.4,849,706,094 ක් වූ චක්‍රීය අරමුදල් ගිණුමේ පැවති ශේෂය නැවත ණයදීමේ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණු අතර 2011 දෙසැම්බර් 31 වන විටත් අක්‍රීයව පැවතුණි.

**(ඈ) ඌන පූර්ණය**

------------

2010 දෙසැම්බර් 03 දින ඉල්ලුම් කරන ලද අංක 92 දරන ඌන පූර්ණ ඉල්ලුම් පත්‍රයට අදාළව රු.7,965,524 ක මුදලක් ශේෂ පත්‍ර දිනයට ශ්‍රී ලංකා මහ බැංකුවේ අග්‍රිම අරමුදල් ගිණුමට ඌන පූර්ණය කර නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2 වගන්තියට ප්‍රකාර, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ මූලික කාර්ය මණ්ඩලයෙන් සමන්විත " ප්‍රධාන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය " ලෙස හඳුනා ගන්නා ලද කණ්ඩායමක් ව්‍යාපෘතියේ කටයුතු පහසුවෙන් හා කාලීන ක්‍රියාත්මකවීම තහවුරුවීම සඳහා යොදවා ගත යුතුය. කෙසේ වුවද, ලබාගත හැකි වූ තොරතුරු අනුව, අවස්ථා කිහිපයකදීම ඉහත කී උපදෙස් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(ඇ) එස්එම්අයිඑල්ඊ (SMILE) III ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශයට 2010 අප්‍රේල් මාසය තුළ මාරු කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ මූලික කාර්ය මණ්ඩලයෙන් සමන්විත " ප්‍රධාන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය " ලෙස හඳුනාගත් කණ්ඩායමක් ව්‍යාපෘති කටයුතු පහසුවෙන් හා කාලීනව ක්‍රියාත්මක වීම තහවුරුවීම සඳහා මෙතෙක් පත් කර ගෙන නොතිබුණි.

(ආ) කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයට ව්‍යාපෘතිය මාරු කිරීමට පෙර, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරි , වියපැහැදම් නිලධාරි හා සංඛ්‍යාලේඛන / කළමනාකරණ තාක්ෂණ පද්ධති නිලධාරි යන මූලික තනතුරු සඳහා බඳවා ගෙන නොතිබුණි. තවද , ගිණුම් සහකාර , රියදුරු , දත්ත සැකසුම් නිලධාරි , කාර්යාල සහකාර යන තනතුරු සහ පුහුණුවන්නන් තිදෙනෙක් ඇතුළත් සේවකයන් 07 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් තොරව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගෙන තිබුණි.

## 3.5 නොවිසඳුණු විගණන ප්‍රශ්න

-----------------------------

ලබාගත හැකිව තොරතුරු අනුව , මාගේ පෙර වර්ෂ වල විගනන වාර්තා වලින් හඳුනාගෙන හා ව්‍යාපෘතියේ කළමනාකාර්ත්වයට වාර්තා කරන ලද පහත සඳහන් විගණන ප්‍රශ්න මෙතෙක් නිවැරදි කර නොතිබුණු බව අනාවරණය විය.

(අ) කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයට ව්‍යාපෘතිය මාරු කිරීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු හඳුනාගන්නා ලදී.

(i) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පුරප්පාඩු වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේදී ඉල්ලුම්පත්‍ර කැඳවීමෙන් අමාත්‍යාංශය විසින් එම පරිපාටිය අනුගමනය කර තිබූ අතර , සම්මුඛ පරීක්ෂණයේදී ඉහළ ලකුණු ( ලකුණු 83 ) ලබාගත් තැනැත්තා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට නිර්දේශ කර තිබුණි. එහෙත් ඒ වෙනුවට සම්මුඛ පරීක්ෂණයේදී අඩුම ලකුණු ( ලකුණු 43 ) ලැබූ තැනැත්තා 2009 ජූලි 01 සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත තනතුර සඳහා පත් කර තිබුණි. ඊට අමතරව ඉහත තනතුරට අඩුම ලකුණු ලබාගත් තැනැත්තා තෝරා ගැනීම සාධාරණීයකරණය කර නොතිබූ අතර, සම්මුඛ පරීක්ෂණයේදී තෝරා ගත් තැනැත්තාට වඩා ඉහළ

ලකුණු ලබාගත් තැනැත්තා ප්‍රතික්ෂේප කිරීමට හේතු විගණනයට පැහැදිළි කර නොතිබුණි.

(ii) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2 වගන්තියට අනුව, " ප්‍රධාන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය " ඇතුළු සියළුම තනතුරු වලට පත් කිරීමේදී විවෘත දැන්වීමක් මගින් ඉල්ලුම්පත්‍ර කැඳවීමෙන් පසු හා සම්මුඛ පරීක්ෂණ මගින් සිදුකළ යුතුය. අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පරිසර නිලධාරි තනතුරු සඳහා එම පටිපාටිය අනුගමනය කිරීමේදී, පුවත්පත් දැන්වීමේ සඳහන් කරන ලද මූලික අවශ්‍යතාවයන්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වු එකම අයදුම්කරුවකු හෝ සම්පූර්ණ කර නොතිබුණු අතර ඒ අනුව එම තනතරට කිසිදු තැනැත්තකු නිර්දේශ කර නොතිබුණි. කෙසේ වුවද, අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් හා පලපුරුද්ද නොමැති තැනැත්තකු සම්මුඛ පරීක්ෂණයට සහභාගීවී තිබු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පරිසර නිලධාරි ලෙස ඔහුව බඳවා ගෙන තිබුණි.

(iii) අනුමත කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණක තනතුර ඇතුළත් කර නොතිබුණද , ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.5.4 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක ලෙස පත්කර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් රු.111,378 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2013 ජනවාරි 31 දින වන විටත් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් විගණනයට ලැබී නොතිබුණි.

(ආ) කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයට ව්‍යාපෘතිය මාරු කිරීමට පෙර මෙහෙයුම් වියදම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරන ලද අතර අමාත්‍යාංශය විසින් එම කරුණු නිවැරදි කිරීමට 2013 ජනවාරි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

(i) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 5.2 වගන්තිය අනුව, ව්‍යාපෘති අධ්‍යක්ෂ පමණක් නිල වාහනයක් පාවිච්චි කිරීමට හා දෙපාර්තමේන්තු ප්‍රධානියකුගේ තත්ත්වයෙන් මාසික ඉන්ධන දීමනාවකටද හිමිකම් ලබයි. කෙසේ වුවද, ඉහත විධිවිධාන වලට පටහැනිව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සඳහා ව්‍යාපෘති වාහනයක් පාවිච්චි කිරීමට අමාත්‍යාංශ ලේකම් විසින් අවසර දී තිබුණි. තවද 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන හා 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, දීමනා ලබාගැනීමට හිමිකම්

නොමැති නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂට 2009 ජුලි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.110,455 ක මුදලක් වාහන දීමනා හා රු.93,600 ක මුදලක් ඉන්ධන දීමනා ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ගෙවා තිබුණි.

(ii) 2008 අගොස්තු 14 දිනැති අංක 6/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, අමාත්‍යාංශ ලේකම්ගේ විධිමත් අනුමැතිය නොමැතිව උප ව්‍යාපෘති චාරක පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා අතිරේක ඉන්ධන වියදම් ලෙස රු.56,950 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. තවද, එම චාරක පරීක්ෂණ සම්බන්ධයෙන් චාරක පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/1997 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වැටුපෙන් 1/20 ක් ගෙවීම යටතේ මාසයකට එක් දිනයක් පමණක් නිවාඩු දින වැටුප් වලට මාණ්ඩලික නිලධාරීන් හිමිකම් ලබයි. කෙසේ වුවද, විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එක් දිනකට වැඩියෙන් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

**4. පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම

(ආ) මුදල් කළමනාකරණය

(ඇ) පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම